# ගල්වලේ කතාව



BKT 0203
26/08/2023

# ගල්වලේ කතාව

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ප්‍රකාශනය:
ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව

මඟ පෙන්වීම
සුසිල් සිරිවර්දන
(ජනසවිය කොමසාරිස්)

සංස්කරණය
ආර්. එම්. ආර්. අමරරත්න.

චිත්‍ර
සුනිල් ද සොයිසා.

මුද්‍රණය:
තරුණ සේවා මුද්‍රණාලය
මහරගම.

පසුපිටේ විමලරත්න කුමාරගමගේ කවිය
“විවාසිතය”(1946) කවි පෙළෙනි.

# ගල්වළක කතාවක්



ගොඩවාය, දෙහිගහලන්ද, විත්‍රාගල හා මැඩිල්ල යන ගම්වලට මැදිවූ මාතප්ජාව හම්බන්තොටට සැතපුම් 05 ක 06 ක දුරින් පිහිටියේය. තිස්ස - කතරගම ප්‍රධාන මාර්ගයේ සිට බැරගමට යන අබලන් මාවත ගම මැදින් දිවෙයි. අවුරුද්දෙන් මාස හත අටකම පවතින නියගය නිසා ප්‍රදේශය බෙහෙවින් වියළිය. සම්නම් උදැල්ලක් ගැසීමට බැරි තරමින් තද වූ පොළොව ගල් කැටයක් මෙන් සවිමත්ය. පොළෝ කබලට උඩින් ඇති හීන් වැල්ල භෝගයකට ඔරොත්තු නොදෙයි.

බැරගම පාරට උඩු අතින් මූකලානයි. පලු - කොහොඹ - දිවුල් හා මලිත්ත ගසින් ගහන ඒ වනය ගැමි වහරේ දී අන්දර කැලේ බවට පැරී ඇත. පාර පටන් ගත්තා තැන සිට යාර කිහිපයක් ඉදිරියට ගිය විට පහළින් ඇත්තේ ගල්වළයි. ඊට ඔබ්බෙන් නියගයට හසුව දැවී ගිය කුඹුරු යායකි. ලියැදි කෙළවරින්, දෙහිගහලන්ද හා කරවිලයාය මිටියාවත් පෙනෙයි.

ගල්වළ වටා පනොක් හා එරමිණියා වැවී ඇත. කෙළවරක විශාල තුගයකි. කාලයක් තිස්සේ බෝර ගැසීමටත්, කුළු පහරටත් ලක් වූ පර්වතයේ තැනින් - තැන විශාල වළවල්ය. ඒවායින් උඩට මතු වූ ඇතැම් ගල් පතුරක් පිහිතලයක් සේ මුවහත්ව තිබේ. වළවල් නියගයටත් නොසිදෙන ජරාවතුරින් පිරී ඇත. කිහිප තැනක ගොඩැලිය. ඒ මත පැල්පත් හෝ කුඩාරම් තිබූ බවට සළකුණු තිබිණි.

මාස හය හතකට පෙර මිනිස් වාසයක්ව තිබුණැයි සිතිය හැකි ගල්වළ මේ වනවිට පතොක් ගස් වලට යටවෙමින් පවතියි. තවත් මාස කීපයක් ගෙවන විට මුළුමනින් ම වනයට යටවිය හැකි, මේ මිනිස්වාසයෙහි ඉතිහාසය කියා පාන්නට මෙන් තවත් එක් පැල් පතක් ඉතිරිව තිබේ. කඩන ලද ගල් තුඩක් සමීපයෙහි ඉදිකොට තිබූ පැල්පතෙහි කටු - මැටි ගැලවී බිත්තියෙහි බට ලී පෙනෙයි. දොරකඩ වැසීමට වූ දිරාගිය පොල් අතු පැලැල්ල ගෙයි ඉදිරි බිත්තියට හේත්තුකොට තිබිණි. වයස තිස්පහ නොඉක්ම වූ ගැබිණි කතක් ගෙතුළින් එළියට බැස කථාකරන්නට වූහ. ඕ, මාරි අම්මා නම් වූවා ය.

"ඉස්සර ගල්වළට කිව්වේ කොරියාව කියල. මිනිස්සු අපි යනකොට අහක බලාගන්නව. අපේ ළමයි ඉස්කෝලෙ ගියේ නෑ. උන් ගල්කඩපු තැන්වල සෙල්ලම් කරල කකුල් කපාගන්න. ජරාවතුර බීල පාවනේ හදාගන්න. අපට ඉඩම් තිබුනෙ නැහැ. යන්ඩ - තැනක් තිබුණෙත් නෑ. ගල්වළට ආවෙ ඒකයි. මං සයිමනුත් එක්ක දිගකන්ඩ ආවෙ මීට අවුරුදු විස්සකට විතර කලින් එදා ඉඳලම ඉන්නෙ මෙතන. ළමයි පස්දෙනෙක් වුණාට පස්සේ සයිමන් මං අත්ඇරල ගියා මමයි ළමයිනුයි ගල්වලේ නතිවුණා. එදා ඉඳල ජනසවිය ලැබෙනකම්ම මං අනන්ත දුක් වින්ද. ජනසවියෙන් පස්සෙ අත නැති ජයතිංහ මෙහෙ එන්ඩ - යන්ඩ පටන්ගන්න. එත් ගෑනු කේලම් කියල ඒක නැති කෙරුව. අවුරුදු හතකට පස්සෙ ආයෙත් සයිමන් ආවා. දැන් ඉස්සර වාගෙ රණ්ඩු නෑ. අගහිඟකම් අඩුයි. අනෙක් හැමෝම මෙතන අත්ඇරල "ප්‍රබෝධගම" පදංචියට ගියා. ඒත් අපට යන්ඩ හිනක් නෑ. ගල්වළ තියෙනකම් අපි මෙතනම ඉන්නවා."

ජනවාරි මාසයේ සිට ඔක්තෝබරය තෙක් අඛණ්ඩව පවතින නියඟය නිසා මේ ගම්වල වැවිල්ලක් කිරීම අපහසු ය. එහෙත් මේ පලාතේ පොළොවට බෙහෙවින් යටවූ විශාල කළු - ගල් තට්ටුවක් දක්නට ලැබෙයි. බොහෝ දෙනකුගේ ජීවන මාර්ගය කළු - ගල් කැඩීමයි. වලස්මුල්ල, හක්මන, බෙලිඅත්ත, තංගල්ල, මිද්දෙණිය වැනි ප්‍රදේශවල කළුගල් අවශ්‍යතාවය සපුරන්නේ මේ ගම්වල නිෂ්පාදනයෙනි.

මාතප්පාවේ ගල්වළ කළු - ගල් කැඩීමට ප්‍රකට තැනයි. වෙඩි - බෙහෙත් හෝ ඩයිනමයිට් ගැනීමට තරම් වත්කමක් හෝ දැන හැඳුනුම් කමක් ගල්කඩන ඇත්තන්ට නොවෙයි. ඒ සඳහා විය පැහැදම් කළහැකි අතර මැදියෝ සිටිති. ගල්කඩන්නා කරන්නේ කුලියකි. ඉඩම් නොමැතිකම, නූගත්කම හා දුප්පත්කම ගල්කඩන බොහෝ දෙනෙකුගේ උරුමය යි.

මීට අවුරුදු විස්සකට පමණ පෙර පදිංචියට ඉඩමක් නොවූ ගල්කඩන්නෝ රසක් සිය දරු පවුල් සමග ගල්වළෙහි පදංචි වූහ. මුළු පවුල් ගණන 16 කි. පැල්පත් වලට පොල් අතු අවුරා තිබිණි. සෙල්ලම් ගෙවල් බඳු මේ පැල්පත්වල වෙසෙන ගල්කඩන්නන් අන්‍යයන්ගේ අවඥවට ලක්විය.

කාෂ්ට අවුවේ කළු - ගල් හා ඔට්ටුවන මිනිසුන් ගැන්දැවේ ඇඟපත රුදාවට හැලි - අරක්කු බොති. වෙරිමතින් ගල් වලට එන ඔවුහු පරුස බස් දොඩති. බිරියන්ට තලති. එකිනෙකා හා කලහ කරති. පී. කේ. රෝහිණී, ඒ අන්දැකීම් වලට මුහුණ දුන්න අම්ම කෙනෙක්.



"මිනිස්සු හැමදාම බොනව. ඒක නවත්වන්න මොන යක්කරයටවත් බෑ. එක අතකින් ඒ කාලෙ ලැජ්ජ වෙන්ඩ දෙයක් තිබුණෙත් නෑ. හැම කෙනෙක්ම අපි කොත් කෙරුව. කිසි මිනිහෙක් තිබහට වතුර ටිකක් දුන්නෙ නෑ. එහෙම ඉන්නකොට අපේ මිනිස්සු තව තවත් වැරදිවලට පෙළඹුණා."

"දවසක් බෝරයක් පුපුරල අපේ ගේ ඇතුළට විශාල ගල්කුට්ටියක් විසිවුණා. මගෙ ළමය බේරුණේ යාන්තමට ගල්කුට්ටිය වහලෙන් කඩාගෙන බිමට වැටුණ. මං එදා දවසම ඇඬුව. මං හිටියෙ කවදාවත්ම අපට මේ වළෙන් ගොඩ එන්න බැරිවෙයි කියලයි."

"ඒ කාලෙ අව්වට ගල රත්වෙනකොට යකෙකුටවත් ගෙවල් ඇතුලෙ ඉන්ඩ බෑ. පොඩි එවුන් කෑගහනව. මහන්සි වෙලා වැඩකරන මිනිස්සු මේ කරදර නිසා හැමදාම බිව්ව. හම්බකරන තුට්ටු දෙක බීමට ගියාම අපි කන්නෙ මොනවද?. මේව ගැන හිතනකොට මැරෙන්ඩ හිතුන වාර අනන්තයි. ජනසවිය ලැබුනට පස්සෙයි ඒ බරින් අපි නිදහස් වුණේ."

ඔවුහු බෙහෙවින් අසරණ වූහ. හාල් හුණ්ඩුව, පොල් බෑය, මිරිස් කරල හා ලුණු ඇටය පවා අනෙකකුගෙන් ණයට ගත්හ. ඇතැම් විට බුලත්විටකට හෝ බීඩියකට රණ්ඩු- සරුවල් කරගත්හ. එහෙත් මොවුන් අමනුෂ්‍යයන් ද? ඔවුන් කොන්කළ යුතු ද?

ගල්වළෙහි වූ පැල්පත් වලට ඉළුක් හෝ දිරාගිය පොල්අතු වසා තිබිණි. ගෙබිම ගොරහැඩිය. ඇතැම් ඉඩෝරයකට ගෙතුල වැලිමැක්කෝ බෝවුණහ. ගල්වළෙහි ඇත්තන්ගේ ජීවිතත් මේ පරිසරයට ඔරොත්තු දෙන අයුරින් ගොරෝසුවිය.



ළමයි වට පිටාවේ කැතකළහ. අපිරිසිදුකම නිසා පණු - රෝග, කක්කල් කැස්ස හා පාචනය නිතර ළමයින් අතර පැවතිණි. ඇතැම්විට වැඩිහිටියෝ මැලේරියාවෙන් පෙළුණහ. සියළු ලෙඩ -රෝග - අපල - උපද්‍රව නිසා ඇතිවෙතැයි මේ මිනිස්සු විශ්වාස කළහ. රෝග සුවකරත්තැයි දෙවියන්ට කත්තලව් කිරීම, යක්ෂයන්ට දොළපිදේනි දීම හෝ නූල් බැඳීම ඔවුන්ගේ සිරිත විය.

බෝරයක් සවිකරද්දී පිපිරී යෑම නිසා ඇතමකුගේ සිරුර පිළිස්සී තිබිණි. එහෙත් ඒවාට වන්දියක් නැත. ඔවුන්ගේ රැකියාව බෙහෙවින් අවදානම් ය. අනොරක් නොමැතිව වැඩකළත් නිසි ශ්‍රමඵලය ගල් කඩන්නන්ට නොලැබිණි. අතර මැදියෝ ඔවුන් ගසාකෑහ. මේ කාලය වනවිට ගල්කඩන්නෝ දුප්පත් කමින් අන්තයටම හෙම්බත් වී සිටියහ.

1989 අග භාගයේ දී ජනසවිය සමීක්ෂක කණ්ඩායමක් ගල්වළට පැමිණියහ. සමීක්ෂක කණ්ඩායමට දකින්නට ලැබුනේ කුසගින්නේ කිරාවැටෙන ළමයින් හා කාෂ්ට අව්වේ ගල්කඩන වැඩිහිටියන් ය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අන්ත දුප්පත්ම කණ්ඩායම හැටියට ගල්කඩන්නන්ගේ පවුල් තෝරාගැනිණි. ඒ පිළිබඳව කථාකළ ගල්වලෙහි කේ. රූපා,

"මුලදිනම් අපට ජනසවිය ගැන එතරම් විශ්වාසයක් තිබුණෙ නැහැ. ඒත් පසු වෙනකොට ජනසවිය නිසා අපි හැමෝගෙම ජීවිත වෙනස්වුනා. ජනසවිය ලැබිල වැඩි කාලයක් යන්න කලින් අතර මැදියන් නැතිව අපිම ගල්කඩල විකුණන්න පටන්ගන්න. ඊට පස්සෙ ගල්වලෙන් එළියට ඇවිත් අලුත් ගෙවල්වල පදිංචිවෙන්න අපට ඕනැ වුණා. අණ්ඩුවෙ අවසරය අරගෙන මාතප්ජාවෙ අන්දර කැලේ එළිකරගන්න ගියා. ඒත් අනවසරයෙන් ඉඩම් අල්ලගෙන හිටපු අය අපට බාධා කෙරුව. කෝලාහල කරන්නත් ආව. කොහොම වෙනත් අපේ සමගිය නිසා



අපි ජයගත්තා. අපි අන්දර කැලේ පදංචිවුණා. දැන් අපේ ගමට කියන්නෙ ප්‍රබෝධගම කියල. ගමේ පාරවල් හදන්නෙ අපි. ගෙවල් හදන්නෙ අපි. දැන් මේක අපේ ගම.

"අපේ ළමයි දැන් ඉස්කෝලෙ යනව. පිරිමි බොනව අඩුයි. රණ්ඩු -සරුවල් අඩුයි. අපේ අනාගතේ එතරම් නරක නැහැ කියල අපට හිතෙනවා."

ප්‍රබෝධගම. කටුලැහැබ් සහිත මිටි මූකලානකින් වට වූ පුංචි ගමකි. එහි උළු සෙවිලි කළ ගෙවල් ඉදිවෙමින් පවතියි. ගමට යන පාර ගල්කඩන්නන් විසින් ඉදිකැරගෙන තිබේ. කරත්තයකට හෝ බයිසිකලයකට පහසුවෙන් යා හැකි මේ පාරේ ළමයි ටයර් පදවති. උදේට පොත් - මිටි ගෙන පාසල් යති. තව නොබෝ දිනකින් පාර දිගේ වාහනයක් ඒමට බැරි නැත. මෙතෙක් වැසිකිළි වෙනුවට අන්දර කැලේ පාවිච්චි කළ ඔවුනු එක් ගෙදරකට වැසිකිළිය බැගින් තනාගත්හ.

දැන් ඔවුන් ගල්කඩන්නේ කුලියට නොව. තමන්ගේම වෙළදාම සඳහාය. ගණන් හිලව් කථාකරන්නේත් මුදල් ගනු - දෙනු කරන්නේත් ඔවුන් ය. ජනසවිය අපේ ජීවිතවල මහ පෙරළියක් කළා යැයි ඔවුනු කියති.

වෙනදා මෙන් මානප්ජාව රැළිබිමට ඉහළින් හිරු පායයි. කරච්චලයාය හරහා එන මුදු හුළඟ ගල්වළ හරහා හමායයි. එහෙත් වෙනසකි; මහ පෙරළියකි; එදා ගල්වළට කොටු වී සමාජය විසින් කොන්කරනු ලැබූ මිනිසුන් කෝ ! ? ඔවුන්ගේ ජීවිත අලුත් වී ඇත. මේ වනාහී ජනසවියේ තවත් එක් අත්දැකීමකි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනසවිය
சன சக்தி
JANA SAVIYA

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

# ජනසවිය කොමසාරිස් දෙපාර්තමේන්තුව

අංක 17,
බාර්න්ස් පෙදෙස,
කොළඹ 07.

සාගත වසංගත හැම මග හැරියන්
මහට ම වගේ යළටත් වැව පිරියන්
හැම දියුණුව ම පිළිබඳ කිරි' තිරියන්
වත්තිය වෙනස් වූ ද මා මැරියන්

තරුණ සේවා මුද්‍රණාලය
මහරගම.

2/=